# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 01

## රාජ්‍ය ආර්ථිකය

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# වෙළඳපල අසමත් වීම යනු:

සමාජයේ යහපත උදෙසා හිඟ සම්පත් බෙදා වෙන් කිරීමේ ලා වෙළඳපල යන්ත්‍රණය අසමත්වීම වෙළඳපල අසමත් වීම යන්නෙන් අදහස් කෙරේ.

## වෙළඳපොළ අසමත් වීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතු

- සම්පත් බෙදීයාම අකාර්යක්ෂම වීම
- ආදායම් බෙදීයාමේ විෂමතාවය
- සාර්ව ආර්ථික අස්ථායිතාව

## 1. සම්පත් බෙදීයාම අකාර්යක්ෂම වීම

ආර්ථිකය සතු හිඟ සම්පත් සමාජයට හිතකර අයුරින් බෙදී නොයාම සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතාවය ලෙස හඳුන්වයි.
මෙහිදී මිල ආන්තික පිරිවැය ට **(MC ≠ p)** සමාන නොවේ.

### සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතාවයට හේතු

- පොදු භාණ්ඩ නොසැපයීම
- අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්තව පාරිභෝජනය නොවීම
- සුභසාධන භාණ්ඩ ප්‍රශස්ත වන නොසැපයීම
- සමාජයට අහිතකර භාණ්ඩ සැපයීම
- පොදු සම්පත් අධි භාවිතය
- බාහිරතා සැලකිල්ලට නොගැනීම
- අපූර්ණ තරඟය හා ඒකාධිකාරිත්වය
- අපූර්ණ තොරතුරු

# පොදු භාණ්ඩ

ගෙවීමක් නොකරන පුද්ගලයන් අදාළ භාණ්ඩයේ පාරිභෝජනයෙන් ඉවත් කළ නොහැකි හා පාරිභෝජනය තරඟකාරීත්වයක් නොමැති භාණ්ඩ පොදු භාණ්ඩ වේ.

පොදු භාණ්ඩ වල ආන්තික පිරිවැය ශූන්‍ය වේ.

## පොදු භාණ්ඩවල ලක්ෂණ

- ගෙවීමක් නොකරන පුද්ගලයන් අදාළ භාණ්ඩයේ පාරිභෝජනයෙන් ඉවත් කළ නොහැකි
- පාරිභෝජනය තරඟකාරීත්වයක් නොමැති

උදා - ඔරලෝසු කණු, ජාතික ආරක්ෂාව, වීථි ආලෝකය ප්‍රදීපාගාර

# ගෝලීය පොදු භාණ්ඩ

ජාතික දේශ සීමාව ඉක්මවා ගිය පොදු භාණ්ඩ මෙලෙස හඳුන්වයි ගෝලීය

ගෝලීය පොදු භාණ්ඩ වල ලක්ෂණ

- පාරිභෝජනය තරඟකාරීත්වයක් නොමැති වීම
- පරිභෝජනය සීමා කළ නොහැකි වීම
- එහි ප්‍රතිලාභ ලොවපුරා සිටින සියලු දෙනාටම භුක්ති විඳීමට හැකිවීම.

උදා - දැනුම, මූල්‍ය ස්ථායිතාව, ලෝක සාමය, වායුගෝලය

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 02

## රාජ්‍ය ආර්ථිකය

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# අර්ධ පොදු භාණ්ඩ

ධාරිතා මට්ටමකට ළඟා වනතුරු තරගකාරිත්වයක් දැකිය නොහැකි පරිභෝජනය සීමා කළ හැකි භාණ්ඩ අර්ධ පොදු භාණ්ඩ වේ.

මෙහි ලක්ෂණ

- ධාරිතා මට්ටමකට ළඟා වනතුරු තරඟකාරීත්වයක් නොමැති වීම.
- පරිභෝජනය සීමා කළ හැකි වීම

උදා - මහමාර්ග, මුහුදු වෙරළ, කෞතුකාගාර

## සුභසාධන භාණ්ඩ

පරිභෝජනයේදී පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා විශාල වශයෙන් සමාජ ප්‍රතිලාභ ලැබෙන භාණ්ඩ සුභසාධන භාණ්ඩ වේ.

උදා - අධ්‍යාපනය, සෞඛ්‍යය, සනීපාරක්ෂාව.

## අවගුණ භාණ්ඩ

අවගුණ භාණ්ඩ යනු පරිභෝජනය නිසා අවශේෂ සමාජය කෙරෙහි සෘණ බාහිරතා හෙවත් අහිතකර පිරිවැයක් ඇති කරන භාණ්ඩ වේ.

උදා - දුම්වැටි, මත්ද්‍රව්‍ය, මත්වතුර

# පොදු සම්පත්

පරිභෝජනය සීමා කළ නොහැකි පාරිභෝජනය තරගකාරීත්වයක් දැකිය හැකි සම්පත් වේ.

මෙහි ලක්ෂණ

- ප්‍රතිලාභ ලබන්නන් හා පරිභෝජනය සීමා කළ නොහැකි වීම
- පාරිභෝජනය තරගකාරිත්වයක් දක්නට ලැබීම

උදා - තෘණ භූමි වායුගෝලය

## බාහිරතා

කිසියම් නිෂ්පාදන හා පාරිභෝජන ක්‍රියාවක් නිසා එම ක්‍රියාව කරන පුද්ගලයන් නොසලකන නමුත් බාහිර පාර්ශවයන්ට ඇතිකරන පිරිවැය හා ප්‍රතිලාභ බාහිරතා වේ.

## අපූර්ණ තරඟය හා ඒකාධිකාරී

වෙළඳපොළවල් මගින් පාරිභෝගිකයා සූරාකෑමට ලක්වේ. එය මිලට ආන්තික පිරිවැය සමාන නොකරයි.

# අපූර්ණ තොරතුරු

පාරිභෝගිකයන්ට හා නිෂ්පාදකයන්ට තීරණ ගැනීමට අවශ්‍ය කරන තොරතුරු වෙළෙඳපොළ මඟින් සම්පූර්ණයෙන්ම නිවැරදිව ලබාගත නොහැකිවීම අපූර්ණ තොරතුරු ලෙස හැඳින්වේ.

එයට හේතු

- ප්‍රචාරණය නිසා සැබෑ තොරතුරු විකෘති වීම
- සංකීර්ණ තාක්ෂණික කරුණු පිළිබඳ ඇතැම් තොරතුරු ලබාදීමට අපහසු වීම
- ඇතැම් ප්‍රතිලාභ පිළිබඳ අවශ්‍යතා පැවතීම

## 2. සාර්ව ආර්ථික අස්ථායීතාවය

**විරැකියාව, උද්ධමනය, ආර්ථික පසුබැසීම ආර්ථික ප්‍රසාරණයන් මගින් ආර්ථිකය නිතර නිතර උච්චාවචනයන් ඇති කිරීම. මෙහිදී සමස්ථ ඉල්ලුම සමස්ත සැපයුම ට සමාන නොවී සමස්ත ඉල්ලුම හා සමස්ත සැපයුම උච්චාවචනය වීමක් සිදුවේ.**

## 3. ආදායම් බෙදීයාමේ විෂමතාවය

ආදායම් බෙදීයාමේ විෂමතාවය යනු රටේ සමස්ත ආදායම හෝ සම්පත් සෑම පුද්ගලයකුට ම ජීවත්වීමට අවශ්‍ය ආදායම් මට්ටමක් වත් ලැබෙන අයුරින් සමස්ත ජනගහනයේ අතර බෙදී නොයාමයි.

ආදායම් බෙදී යාමේ විෂමතාව ඇතිවීමට බලපාන හේතු

- කැප කරනු ලබන ශ්‍රමය
- අධ්‍යාපන මට්ටම
- උරුමයෙන් ලද දේපල ප්‍රමාණය
- සාධක මිල

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 03

## බාහිරතා

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# බාහිරතා යනු

කිසියම් නිෂ්පාදන හා පාරිභෝජන ක්‍රියාවක් නිසා වෙනත් පාර්ශ්වයක් මත ඇති කරන නිෂ්පාදන හෝ පාරිභෝජන ක්‍රියාවට සෘජුවම සම්බන්ධවන අය විසින් සැලකිල්ලට නොගන්නා ප්‍රතිලාභ හෝ පිරිවැයයි.

වෙනත් පාර්ශවයක් මත ඇති කරන අහිතකර ප්‍රතිවිපාක බාහිර පිරිවැයක් ලෙස සලකනු ලැබේ.

වෙනත් පාර්ශ්වයක් මත ඇති කරන හිතකර ප්‍රතිවිපාක බාහිර ප්‍රතිලාභ ලෙස සලකනු ලැබේ.

බාහිරතා හිතකර ප්‍රතිවිපාක හෝ අහිතකර ප්‍රතිවිපාක හෝ ලෙස ස්වරූප දෙකකි.

හිතකර ප්‍රතිවිපාක ධන බාහිරතා ලෙසත් අහිතකර ප්‍රතිවිපාක සෘණ බාහිරතා ලෙසත් වර්ග කරයි.

බාහිරතා අසල්වැසි ප්‍රතිවිපාක හෝ තෙවැනි පාර්ශ්ව ප්‍රතිවිපාක ලෙස හඳුන්වයි.

# බාහිරතා උපදවන මූලාශ්‍ර දෙකක

1. නිෂ්පාදනය
2. පරිභෝජනය

මෙම මූලාශ්‍ර මත හටගන්නා බාහිරතා ප්‍රභේද හතරකි

| | | |
|---|---|---|
| i. | නිෂ්පාදනය සෘණ බාහිරතා | බාහිර පිරිවැය |
| ii. | නිෂ්පාදනයේ ධන බාහිරතා | බාහිර ප්‍රතිලාභ |
| iii. | පාරිභෝජනය සෘණ බාහිරතා | බාහිර පිරිවැය |
| iv. | පාරිබෝජනය ධන බාහිරතා | බාහිර ප්‍රතිලාභ |

# නිෂ්පාදනයේ සෘණ බාහිරතා යනු

**නිෂ්පාදනයේ සෘණ බාහිරතා යනු කිසියම් නිෂ්පාදන කටයුත්තක් නිසා ඊට සෘජුව සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශවයන්ට ඇතිවන අවාසි හෙවත් අයහපත් බලපෑම් ය.**

උදා -

- **අර්තාපල් වගාවෙන් පාංශු ඛාදනය ඇතිවී ජලාශවල රොන්මඩ තැන්පත් වීම.**
- **කෘෂි භෝග සඳහා කෘමිනාශක භාවිතයෙන් පරිසරය දූෂනය වීම.**

# නිෂ්පාදනයේ ධන බාහිරතා යනු

නිෂ්පාදනයේ ධන බාහිරතා යනු කිසියම් නිෂ්පාදන කටයුත්තක් නිසා ඊට ඍජුව සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශවයන්ට ඇතිවන වාසි හෙවත් යහපත් බලපෑම් ය.

උදා -

- මල් උද්‍යානයක් ඇති කිරීම නිසා මී මැසි පාලනයට වාසිදායක ඇතිවීම.
- වන වගා ව්‍යාපෘති නිසා ජල මූලාශ්‍ර ඇතිවීම.

# පාරිභෝජනයේ සෘණ බාහිරතා යනු

පාරිභෝජනයේ සෘණ බාහිරතා යනු කිසියම් පාරිභෝජන කටයුත්තක් නිසා ඊට සෘජුව සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශවයන්ට ඇතිවන අවාසි හෙවත් අයහපත් බලපෑම් ය.

උදා -

- දුම්පානය නිසා අවට සිටින පුද්ගලයන්ට ඇතිවන අහිතකර බලපෑම්.
- මෝටර් රථ භාවිතයෙන් පිටවන කාබන් ඩයොක්සයිඩ් වායුව මුසුවීම නිසා ඇතිවන අහිතකර බලපෑම්.

# පාරිභෝජනයේ ධන බාහිරතා යනු

පාරිභෝජනයේ ධන බාහිරතා යනු කිසියම් පාරිභෝජන කටයුත්තක් නිසා ඊට සෘජුව සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශවයන්ට ඇතිවන වාසි හෙවත් යහපත් බලපෑම් ය.

උදා -

- බෝවන රෝග සඳහා ලබාදෙන එන්නත් මඟින් සියලුම දෙනාට හිතකර බලපෑම් ඇතිවීම.
- දෙමුහුන් වාහන භාවිතයෙන් සමාජයට සහ පරිසරයට හිතකර බලපෑම ඇති වීම.

- එසේම නිෂ්පාදන ක්‍රියාවලියක් නිසා එහි සියලුම පිරිවැය නිෂ්පාදකයන් විසින් දරන්නේ නම් හෝ කිසියම් පාරිභෝජන කටයුත්තක් නිසා එහි සියලුම ප්‍රතිලාභ පාරිභෝගිකයාට හිමිවන්නේ නම් වෙළෙඳපොළ කාර්යක්ෂම වේ.

- නමුත් බාහිරතා නිසා එය එසේ සිදු නොවේ බාහිරතා නිසා පෞද්ගලික පිරිවැය හා සමාජ පිරිවැය අතර පෞද්ගලික ප්‍රතිලාභ හා සමාජ ප්‍රතිලාභ අතරත් වෙනසක් ඇතිවේ.

- එම නිසා වෙළෙඳපොළ අකාර්යක්ෂම වේ

## පෞද්ගලික පිරිවැය

නිෂ්පාදන හෝ පාරිභෝජන කටයුත්තකට සෘජුව සම්බන්ධ වීමෙන් දරන පිරිවැයවේ.

## පෞද්ගලික ප්‍රතිලාභ

නිෂ්පාදන හෝ පාරිභෝජන කටයුත්තකට සෘජුව සම්බන්ධ වීමෙන් ලැබෙන ප්‍රතිලාභ වේ.

## බාහිර පිරිවැය

කිසියම් නිෂ්පාදන හෝ පාරිභෝජන ක්‍රියාවලිය නිසා බාහිර පාර්ශවයන්ට දැරීමට සිදුවන පිරිවැය වන අතර එම පිරිවැය අදාළ නිෂ්පාදන කටයුත්තට සම්බන්ධ නැති බාහිර කණ්ඩායම් විසින් මෙම පිරිවැය දරනු ලැබේ.

## බාහිර ප්‍රතිලාභ

කිසියම් නිෂ්පාදන හෝ පාරිභෝජන ක්‍රියාවලියක් නිසා බාහිර පාර්ශවයන්ට ඇතිවන ප්‍රතිලාභ වේ. ඒ වෙනුවෙන් ගෙවීමක් සිදු නොකරයි.

## සමාජ පිරිවැය

කිසියම් නිෂ්පාදන කටයුත්තක් හෝ පාරිභෝජන කටයුත්තක් නිසා සමස්ත සමාජය විසින් දරන පිරිවැය සමාජ පිරිවැය ලෙස හඳුන්වයි.

**සමාජ පිරිවැය = පෞද්ගලික පිරිවැය + බාහිර පිරිවැය**

## සමාජ ප්‍රතිලාභ

කිසියම් නිෂ්පාදන කටයුත්තක් හෝ පාරිභෝජන කටයුත්තක් නිසා සමස්ත සමාජයට ලැබෙන ප්‍රතිලාභ සමාජ ප්‍රතිලාභ ලෙස හඳුන්වයි.

**සමාජ ප්‍රතිලාභ = පෞද්ගලික ප්‍රතිලාභ + බාහිර ප්‍රතිලාභ**

- පූර්ණ තරගකාරී වෙළදපොලක සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව ඉටුවන්නෙ මිල ආන්තික පිරිවැය ට **(MC = P)** සමාන වන අවස්ථාවේදීය
- එසේ නොවන අවස්ථාවලදී ප්‍රශස්ත මට්ටමෙන් සම්පත් බෙදීයාමක් සිදුනොවේ.
- බාහිරතා ධනාත්මක සෘණාත්මක හෝ කවර ස්වරූපයක් ගනු ලැබූවද ඒවායේ ප්‍රතිඵලය වන්නේ සමාජ පිරිවැය හෝ පෞද්ගලික පිරිවැය අතර නොගැලපීමක් ඇති කිරීම හෝ සමාජ ප්‍රතිලාභ හෝ පෞද්ගලික ප්‍රතිලාභ අතර නොගැලපීමක් ඇති කිරයි.
- එම නිසා සම්පත් බෙදීයාම අකාර්යක්ෂම වේ.

එය පහත රූපසටහන් මඟින් දැක්විය හැක

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 04

## බාහිරතා

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

## නිෂ්පාදනය සෘණ බාහිරතා

ආන්තික පෞද්ගලික පිරිවැය MPC $<$ ආන්තික සමාජ පිරිවැය MSC

## නිෂ්පාදනයේ ධන බාහිරතා

ආන්තික පෞද්ගලික පිරිවැය MPC $>$ ආන්තික සමාජ පිරිවැය MSC

## පාරිභෝජනය සෘණ බාහිරතා


ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ MPB $>$ ආන්තික සමාජ ප්‍රතිලාභ MSB

## පාරිබෝජනය ධන බාහිරතා

ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ MPB $<$ ආන්තික සමාජ ප්‍රතිලාභ MSB


# නිෂ්පාදනයේ සෘණ බාහිරතා යනු

**ආන්තික පෞද්ගලික පිරිවැය MPC < ආන්තික සමාජ පිරිවැය MSC**




# නිෂ්පාදනයේ ධන බාහිරතා යනු

**ආන්තික පෞද්ගලික පිරිවැය MPC > ආන්තික සමාජ පිරිවැය MSC**




# පාරිභෝජනය ඍණ බාහිරතා

## ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ MPB > ආන්තික සමාජ ප්‍රතිලාභ MSB



# පාරිභෝජනය ධන බාහිරතා

**ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ MPB < ආන්තික සමාජ ප්‍රතිලාභ MSB**




# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 05


## බාහිරතා

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
**BA (sp) Economics (SUSL)**


# නිෂ්පාදනයේ සෘණ බාහිරතා වලදී සම්පත් බෙදීයාම අකාර්යක්ෂම වීම නිරූපනය කිරීම




# නිෂ්පාදනයේ ධන බාහිරතා වලදී සම්පත් බෙදීයාම අකාර්යක්ෂම වීම නිරූපනය කිරීම



# පාරිභෝජනයේ ඍණ බාහිරතා වලදී සම්පත් බෙදීයාම අකාර්යක්ෂම වීම නිරූපනය කිරීම



# පාරිභෝජනයේ ධන බාහිරතා වලදී සම්පත් බෙදීයාම අකාර්යක්ෂම වීම නිරුපනය කිරීම



# බාහිරතා නිසා ඇති වන වෙළඳපළ බිඳවැටීම මඟහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග

- පාරිසරික බදු පැනවීම
- බලපත්‍ර නිකුත් කිරීම
- ධන බාහිරතා සඳහා සහනාධාර ලබාදීම
- පෞද්ගලික කේවල් කිරීම්
- රජය මගින් දඩ නියම කිරීම
- ඍන බාහිර සඳහා බදු අය කිරීම

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 06

## වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය පහත පරිදි දැක්විය හැක

1. සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීම

2. ආදායම් හා ධනය සාධාරණ බෙදාහැරීම

3. සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම

4. තිරසාර සංවර්ධනය ඇති කිරීම

## 1. වෙළෙඳපොළ ආර්ථිකයක දක්නට ලැබෙන සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතාවය ඉවත් කිරීම සඳහා රජය පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි

- පොදු භාණ්ඩ වලින් මිලක් අයකල නොහැකි නිසාත් ලාභයක් ලැබිය නොහැකි නිසාත් වෙළෙඳපොළ ක්‍රමයෙන් පොදු භාණ්ඩ නොසපයයි එහෙත් රජය මැදිහත්වී පොදු භාණ්ඩ සපයයි.
- වෙළඳපළ ක්‍රමයේ දී අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත ලෙස නොසැපයීම නිසා රජය විසින් අර්ධ පොදු භාණ්ඩ සැපයීම සිදුකරයි.
- සුබසාධන භාණ්ඩ ප්‍රශස්තව සැපයීම සිදු නොවන නිසා ඌණ පරිභෝජනයක් සිදුවේ මේ නිසා සුභසාධන භාණ්ඩ පරිභෝජනයට පෙළඹවීමට රජය මැදිහත්වේ.
- වෙළෙඳපොළ ක්‍රමයක් සමාජයට අහිතකර භාණ්ඩ සමාජයට ප්‍රශස්ත මට්ටමට වඩා වැඩියෙන් නිපදවන නිසා ඒවා සීමා කිරීමට රජයට සිදුවේ. උදාහරණ මත්ද්‍රව්‍ය

## 2. සාධාරණත්වය ස්ථාපිත කිරීම සඳහා රජය මගින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලබයි

- ආදායම් හා ධන ප්‍රතිව්‍යාප්තිය ඇති කිරීම.
- ධන සමුච්චනය පිළිබඳ සීමා පැනවීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණය කිරීම.

## 3. සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම

සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීමට උද්ධමනය හා සේවා වියුක්තිය ඉවත් කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදාගනු ලබයි.

# 4. තිරසාර සංවර්ධනය ඇති කිරීම

ආර්ථික, සාමාජීය හා පාරිසරික යන අංශවල තුලනාත්මක වැඩි දියුණුවක් ඇති කිරීම මඟින් තිරසාර සංවර්ධනය සඳහා වෙළඳපල ක්‍රමයක් කටයුතු නොකරන නිසා ඒ සඳහා රජයේ සඳහා මැදිහත්වේ.

## ආණ්ඩුවේ අසමත් වීම්

නීති පද්ධතිය, උසාවිය, නියාමන ආයතන ආදිය, ළමා රැකවරණය, වැඩිහිටි රැකවරනය වැනි කටයුතු සඳහා වෙළෙඳපොළ ක්‍රමයක අවධානය යොමු නොවන හෙයින් රජයට ඒ සඳහා මැදිහත් වීමට සිදුවේ.

වෙළෙඳපොල අසාර්ථකවීම් මැඩ පවත්වා ගැනීම සඳහා රජය මැදිහත් වී විශාල කාර්යභාරයක් ඉටු කළ ද ආණ්ඩුව අසමත් වීම් සිදුවිය හැකිය.

# ආණ්ඩුව අසමත්වීමෙන් යනු

වෙළඳපොළ අසාර්ථකවීම් මැඩපවත්වා ගැනීම සඳහා රජය විසින් ආර්ථිකය සඳහා කරනු ලබන මැදිහත්වීම රාජ්‍ය අංශයට ආවේණික වූ ඇතැම් දුර්වලතා කරුණුකොටගෙන අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදී ආර්ථිකය තවතවත් අකාර්යක්ෂමතා බිහිකිරීමයි.

# ආණ්ඩුව අසමත් කෙරෙහි බලපාන හේතු කිහිපයකි

- ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයේ දක්නට ලැබෙන දෘඩතාවය
- දේශපාලන ස්වාර්ථය
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති වල අවිදූර දෘෂ්ටිකත්වය
- අපූර්ණ තොරතුරු මත ප්‍රතිපත්ති කරා එළඹීම.
- සානුබල කෙරෙහි අහිතකර ලෙස බලපෑම.
- පරිපාලන වියදම් ඉහළ යාම

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 07

### රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය.

### i. රාජ්‍ය ආදායම්

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා ආණ්ඩුවේ වියදම් බදු අයකිරීම් සහ ණය ගැනීම් සඳහා වන අදාල වෙනස්කම් සිදු කිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියයි.

## ප්‍රධාන රාජ්‍ය මූල්‍ය උපකරණ

1. රාජ්‍ය බදු
2. රාජ්‍ය වියදම්
3. රාජ්‍ය ණය

## රාජ්‍ය අයභාරය

රාජ්‍ය අයභාරය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකක් පවතී

1. බදු ආදායම
2. බදු නොවන ආදායම

## බදු ආදායම

බදු අය කිරීමේ අරමුණු පහත පරිදි දැක්විය හැක

- ආදායම් හා ධනය බෙදී යාමේ විෂමතාව අවම කිරීම.
- කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සම්පත් කළමනාකරණයට
- ඉහළ සමාජ පිරිවැයක් දරන භාණ්ඩ පරිභෝජනය අධෛර්යමත් කිරීම.
- සමාහාර ඉල්ලුම කෙරෙහි බලපෑම් ඇති කිරීම.
- සමාහාර සැපයුම කෙරෙහි බලපෑම් ඇති

# බදු අය කිරීමේ මූලධර්ම පහත පරිදි දැක්විය හැකිය (යහපත් ක්‍රමයක ලක්ෂණ)

- සාධාරණත්වය
- පිරිමැසුම් සහිතවීම
- පහසුව
- නිශ්චිත වීම
- කාර්යක්ෂමතාවය
- නම්‍යශීලී වීම
- අනුකූල බව

# සාධාරණත්වය සහ මූලධර්මය සඳහා කොන්දේසි දෙකක් ඉටුවිය යුතුය

**1. තිරස් සාධාරණත්වය**

සමාන ආර්ථික හැකියාව ඇති පුද්ගලයන්ගෙන් සමාන ආකාරයට බදු අය කිරීමයි

**2. සිරස් සාධාරණත්වය**

අසමාන ආර්ථික හැකියාවන් ඇති අයගෙන් අසමාන ආකාරයට බදු අය කිරීම.

සාධාරණ බදු ක්‍රමයක් සඳහා ආර්ථික න්‍යාය තුළ ප්‍රකාශ වී ඇති ප්‍රධාන මූලධර්ම දෙකකි.

- ප්‍රතිලාභ මූලධර්මය

ප්‍රතිලාභ මූලධර්මය අදහස් කරනුයේ ආණ්ඩුව මගින් සපයනු ලබන සේවාවන් ගෙන් ප්‍රතිලාභ ලබා ගන්නා ප්‍රමාණය මත ආණ්ඩුවට බදු ගෙවිය යුතුය යන්නයි.

- ගෙවීමට ඇති හැකියාව පිළිබඳ මූලධර්මය

ගෙවීමට හැකියාව යන මූලධර්මයන් කියවෙන්නේ විවිධ පුද්ගලයන්ගේ බදු ගෙවීමේ ශක්තිය අනුව බදු අය කළ යුතුය යන්නයි.

# බදු අනුකූලතාවය යනු

බදු අනුකූලතාවය යනු බදු ගෙවීමට බදු ගොනුකිරීමට බදු වාර්තා කිරීමට බදුගෙවන පුද්ගලයා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වීමයි.

## විතැන් කිරීමේ හැකියාව මත බදු ප්‍රධාන වර්ග දෙකකි

### ඍජු බදු

ඍජුව බද්දටහසු වන පුද්ගලයා හෝ ආයතනය විසින්ම හෝ අදාළ බදු ගෙවීමට සිදුවන බදුවේ. මෙය විතැන් කළ නොහැක අදාල බද්දට යටත් වන පාර්ශවයම බදු ගෙවිය යුතුය. උදා - ආදායම් බදු, දේපල බදු

### වක්‍ර බදු

යම් බද්දක් ගෙවීමට නෛතිකව නියම වූ පුද්ගලයා විසින් එකී බදු බර වෙනත් අයෙකු මත විතැන් කරනු ලැබේ නම් එම බදු වක්‍ර බදු වේ.

මෙහිදී නෛතික වශයෙන් බදු ගෙවනු ලබන පුද්ගලයා සැබෑ වශයෙන් බදු ගෙවන පුද්ගලයාත් අතර පැහැදිලි වෙනසක් ඇතිවේ. උදා - විකුණුම් බදු, දේශීය භාණ්ඩ බදු, රේගු බදු

# බදු පදනම

බද්දට විෂය වන මූලාශ්‍රය බදු පදනම ලෙස හැදින්වේ.බදු පදනම මත බදු වර්ග කිහිපයකි

- ආදායම් බදු
- පාරිභෝජන
- ධන බදු
- ව්‍යාපාර බදු
- විදේශ වෙළදාම මත බදු

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 08

**රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය.**

**ii. රාජ්‍ය ආදායම්**

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# බදු ආපාතය

බද්දක් පැනවූ විට අවසාන වශයෙන් බදු බර දරන්නේ කවුරුන් විසින් ද යන්න නිශ්චිතව හදුනා ගැනීමයි.

නැතහොත් බද්දක් පැනවූ විට එහි බදු බර ආර්ථිකය කවර ඒකක මත කෙසේ බලපාන්නේ දැයි සොයා බැලීමයි.

මේ අනුව බදු ආපාතය ස්වරූප දෙකයි

1. ව්‍යවස්ථාපිත හෙවත් නෛතික බදු ආපාතය

නෛතික වශයෙන් බද්ද කවුරුන් වෙත යොමු කරනවාද යන්නෙන් අදහස් වේ.

2. ආර්ථික බදු අපාතය හෙවත් සැබෑ බදු ආපාතය

ආර්ථික බදු ආපාතය යනු සැබෑ වශයෙන් බදු බර සත්‍ය ලෙස දරන්නේ කවුරුත් යන්නයි.

# බදු අය කිරීමේ අනුපාතික ව්‍යුහය අනුව ආකාර තුනකට වර්ග කළ හැකිය

1. **අනුක්‍රමික බදු**

බදු පදනම වැඩි වන විට අයකරන බදු අනුපාතිකයද වැඩි වේ නම් අනුක්‍රමික බදු වේ. උදා - ආදායම් බදු

2. **සමානුපාතික බදු**


බදු පදනම කොපමන වෙනස් වුවද අයකරන බදු අනුපාතිකයද වෙනස් නොවේ නම් සමානුපාතික බදු වේ. උදා - වැට් බදු

3. **ප්‍රතික්‍රමික බදු**

බදු පදනම වැඩි වන විට අයකරන බදු අනුපාතිකයද අඩු වේ නම් ප්‍රතික්‍රමික බදු වේ. උදා - විකුණුම් බදු

| අදායම් මට්ටම | සමානුපාතික බදු | | ප්‍රතික්‍රමික බදු | | අනුක්‍රමික බදු | |
|---|---|---|---|---|---|---|
| | බදු මුදල | ආදායමෙන් ප්‍රතිශතය | බදු මුදල | ආදායමෙන් ප්‍රතිශතය | බදු මුදල | ආදායමෙන් ප්‍රතිශතය |
| 50000 | 12500 | 25% | 15000 | 30% | 10000 | 20% |
| 100000 | 25000 | 25% | 25000 | 25% | 30000 | 30% |
| 200000 | 50000 | 25% | 40000 | 20% | 80000 | 40% |


බදු



සමානුපාතික බදු

ආදායම


බදු



ප්‍රතික්‍රමික බදු

ආදායම

බදු



අනුක්‍රමික බදු

ආදායම

# ආණ්ඩුව බදු අය කිරීමේ දී හටගන්නා ආර්ථික ප්‍රතිවිපාක

- ආයෝජන කෙරෙහි බලපෑම් ඇති කිරීම
- නිෂ්පාදනය කෙරෙහි බලපෑම් ඇති කිරීම
- පරිභෝජනය කෙරෙහි බලපෑම් ඇති කිරීම
- මිල මට්ටම් කෙරෙහි බලපෑම් ඇති කිරීම
- විදේශ වෙළඳාම කෙරෙහි බලපෑම් ඇති කිරීම
- ආදායම් ව්‍යාප්තිය කෙරෙහි බලපෑම් ඇති කිරීම
- ඉතිරිකිරීම් කෙරෙහි බලපෑම් ඇති කිරීම

# රජයේ බදු නොවන ආදායම්

1. බදු කුලී ආදායම
2. පොළී ආදායම්
3. ලාභ ලාභාංශ ආදායම්
4. කුලී ආදායම්
5. සමාජ රක්ෂණ දායක මුදල්
6. දඩ අය කිරීම්
7. ගාස්තු හා අලෙවි ආදායම් ලබා ගැනීම්

i. ගුවන් ගමන් සේවා හා ගුවන්තොටුපොල සංවර්ධන සමාගම් හරහා කරනු ලබන ගුවන්ගත වන්නන් සඳහා අය කරන ගාස්තු
ii. ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වීසා ගාස්තු
iii. ගමන් බලපත්‍ර ගාස්තු
iv. මෝටර් රථ ලියාපදිංචි කිරීම් ගාස්තු
v. රජයේ පාවිච්චි කළ භාණ්ඩ අලවියෙන් ලැබෙන ආදායම්
vi. ලොතරැයි ආදායම්

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 09

## රාජ්‍ය වියදම් I

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# රාජ්‍ය වියදම්

ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා රජය විසින් කරනු ලබන වියදම් රාජ්‍ය වියදම් වේ.

## රජයේ වියදම් හටගැනීමට හේතු

- හිඟ සම්පත් බෙදා වෙන් කිරීම කාර්යක්ෂම කිරීමට
- ආදායම් විෂමතාවය අවම කිරීමට
- නීතිය හා සාමය ආරක්ෂා කිරීමට
- සමාජ යහපතට හේතුවන පෞද්ගලික අංශය විසින් සැපයීමට ඉදිරිපත් නොවන පොදු සේවා හා ආයතන පවත්වාගෙන යාමට
- ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය ඇති කිරීමට

# රාජ්‍ය වියදම් ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකිය

- වර්තන වියදම් (පුනරාවර්තන වියදම්)
- ප්‍රාග්ධන වියදම් (ආයෝජන වියදම්)
- ශුද්ධ ණය දියම්

## වර්තන වියදම් (පුනරාවර්තන වියදම්)

වර්තන වියදම් යනු නැවත නැවත දැරිය යුතු වියදම් වේ.

අදාළ වර්ෂය තුළ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා දැරිය යුතු වියදම් හා සංක්‍රම දීමනා මීට අයත් වේ.

වියදම් කරන කාලය තුළ ආර්ථිකයට ප්‍රතිඵල ලබා දෙන වියදමකි.

නිදසුන් - සේවක වැටුප් ගෙවීම්, ආහාර සහනාධාර, විශ්‍රාම වැටුප් ගෙවීම්.

## ප්‍රාග්ධන වියදම

ප්‍රාග්ධන වියදම් යනු සාමාන්‍යයෙන් වර්ෂයකට වැඩි කාලයක් පවතින භාණ්ඩ මිලදී ගැනීමටත් ප්‍රාග්ධන සම්පත් බිහිකර ගැනීමටත් ඒවා ප්‍රතිසංස්කරණය කිරීමටත් දරන්නා වූ වියදමය.

නිදසුන් - යන්ත්‍රසූත්‍ර මිලට ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම, රථවාහන මිලට ගැනීම, මහාමාර්ග ඉදිකිරීම

## ශුද්ද ණයදීම්

වර්තන හා ප්‍රාග්ධන වියදම් වලට ඇතුළත් නොවන රාජය විසින් දරනු ලබන වියදම් වේ. අත්තිකාරම් ගිණුම් මගින් ලබා දෙන ශුද්ද ණය දීම්, ආපසු ලැබීම් රාජ්‍ය ව්‍යවසායන්ට ණය ලබාදීම් ආදිය මෙයට ඇතුලත්වේ

රාජ්‍ය වියදම් ඉහත සඳහන් අයුරින් පුළුල් වර්ගීකරණය කළ ද එක් එක් වියදම් ගණන තුළ ඇතුළත් විවිධ වියදම් සංරචක හඳුනා ගැනීමේ අරමුණෙන් වර්තන හා ප්‍රාග්ධන වියදම් ප්‍රධාන වර්ගීකරණ දෙකක් යටතේ වෙන්කර දැක්විය හැකි.

- රාජ්‍ය වියදම
  - ආර්ථික වර්ගීකරණය
    - වර්තන වියදම
      - භාණ්ඩ හා සේවා සඳහා වියදම
      - පොලී වියදම
      - වර්තන පැවරුම් සඳහා සහනාධාර
    - ප්‍රාග්ධන වියදම්
      - මූර්ත වත්කම් අත්පත් කර ගැනීම්
      - ප්‍රාග්ධන පැවරුම්
      - ඌණ වියදම් සඳහා වෙන් කිරීම්
  - කාර්යාත්මක වර්ගීකරණ

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 10

## රාජ්‍ය වියදම් II

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

## භාණ්ඩ හා සේවා සඳහා දරන වියදම් යනු

මහජනතාවට ලබාදෙන විවිධ රාජ්‍ය සේවාවන් සම්පාදනය කිරීම හා පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ.

මෙම වියදම් වල ප්‍රතිලාභය වසරකට සීමාවේ

උදා - ජාතික ආරක්ෂාව, පාසල් අධ්‍යාපනය, රෝහල් සෞඛ්‍ය සේවා, මගී ප්‍රවාහනය

## පොලී ගෙවීම් යනු

රජය දේශීය හා විදේශීය වශයෙන් ලබා ගන්නා ණය වෙනුවෙන් ගෙවනු ලබන පොලී වියදම් වේ.

තනි අයිතමයක් ලෙස ගත් විට රාජ්‍ය වියදම තුල ඇතුළත් විශාලතම වටිනාකමක් ගන්නේ පොලී ගෙවීම්ය.

පොලී ගෙවීම් වැඩි වන විට රාජ්‍ය ඉතුරුම් පහත වැටෙන අතර ආයෝජන සීමා වීම නිසා ආර්ථික වර්ධනයද සීමාවේ සංක්‍රාම වියදමක් ලෙස සලකා ජාතික ගිණුම් වලට ඇතුළත් නොකෙරේ.

# වර්තන පැවරුම් හා සහනාධාර යනු

රජය විසින් විවිධ රාජ්‍ය ආයතනයන්ට සහ කුටුම්භ අංශ වෙත ලබාදෙන සහනාධාරයන් ය.

ආයතනයන්ට ලබාදෙන සහනාධාර ලෙස හඳුන්වන්නේ අලාභ ලබන රාජ්‍ය ව්‍යවසාය පවත්වාගෙන යාම සඳහා රජයෙන් ලබාදෙන අරමුදල් ය.

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය
- ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය
- ලංකා විදුලිබල මණ්ඩලය
- ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ තත්ත්වයන්ට ලබාදෙන සහනාධාර

# කුටුම්භ අංශයට ලබා දෙන සහනාධාර

- සමෘද්ධි සහනාධාර
- විශ්‍රාම වැටුප් (රජයේ විශාලතම සහනාධාර වටිනාකම වේ)
- ආහාර මුද්දර
- ආහාර සහනාධාර
- පාසල් පොත්
- නිල ඇඳුම්
- වාර ප්‍රවේශ පත්‍ර
- දිවා ආහාර
- රණවිරු සොල්දාදුවන් සඳහා ලබාදෙන සහනාධාර
- පොහොර සහනාධාර

සහනාධාර ඉහළ යාම නිසා ආර්ථිකය වෙනත් ප්‍රමුඛතා අංශවලට සම්පත් යෙදවීමට ඇති හැකියාව සීමා කරයි එමගින් රාජ්‍ය ඉතුරුම් පහල වැටෙන අතර ආයෝජන සීමා කිරීම හා අයවැය හිඟය පුළුල් වීම සිදුවේ

## මූර්ත වත්කම් අත්පත් කරගැනීමේ වියදම් යනු

මධ්‍යම රජයෙන් සෘජුවම ප්‍රාග්ධන සම්පාදනයට ආයෝජනය කරන මුදල් ප්‍රමාණයයි.

නිදසුන් - අධිවේගී මාර්ග ඉදිකිරීම

## ප්‍රාග්ධන පැවරුම්

විවිධ රාජ්‍ය ආයතනයන්ට සංස්ථාවන්ට පළාත් පාලන ආයතන වලට ප්‍රාග්ධන සම්පාදනය සඳහා ලබාදෙන නැවත ලබා නොගන්නා මුදල් ප්‍රාග්ධන පැවරුම් ලෙස හැඳින්වේ.

උදා - පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මධ්‍යම රජය විසින් පළාත් සභාවලට මුදල් ලබාදීම

# ඌණ වියදම් සඳහා වෙන්කිරීම්

අදාළ වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රාග්ධන වියදම් මුළුමනින්ම වැය කිරීමට හැකියාවක් නොමැති යැයි අපේක්ෂා කරන විට ප්‍රාග්ධන ශේෂයන් වියදම් ඇස්තමේන්තු වලට ඇතුලත් කරන අතර ඒවා ඌණ වියදම් සඳහා වෙන්කිරීම් ලෙස හඳුන්වයි.

ඌණ වියදම් මගින් ප්‍රාග්ධන වියදම් අඩුකොට දක්වන අතර රාජ්‍ය අයභාරයෙන් අපේක්ෂිත වියදම් පියවා ගැනීමට අතිශයින්ම දුෂ්කර වන අවස්ථාවලදී අයවැයේ හිඟය අඩුවෙන් පෙන්නුම් කිරීමේ උපාය මාර්ගයක් වශයෙන් ඌණ වියදම් ශේෂ ඇසතමේන්තුවලට ඇතුළත් කෙරේ

# රාජ්‍ය වියදම් වල ප්‍රතිවිපාක පහත පරිදි දැක්විය හැකිය

- රාජ්‍ය ඉතුරුම් පහත වැටීම
- රාජ්‍ය ආයෝජන පහලයාම.
- රාජ්‍ය ණය ගැනීම් ඉහල යාම.
- රාජ්‍ය වියදම් පියවීම සඳහා ණය ලබා ගැනීම නිසා පෞද්ගලික අංශයට ලබා දෙන ණය මුදල් ප්‍රමාණය සීමා වීම හා වෙළඳපල ණය පොළී අනුපාතිකය ඉහළ යාමට සහ පෞද්ගලික අංශය ආයෝජන පහත වැටීම.
- ගෙවුම්ශේෂ ගැටලු ඇතිවීම.

# ආර්ථික වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදමේ සංයුතිය පහත දැක්වේ 2018 ද.දේ.නි

| වියදම් | අගය |
|---|---|
| පුනරාවර්තන වියදම් | 14.5 |
| භාණ්ඩ හා සේවා වියදම් | 5.6 |
| පොලී ගෙවීම් | 5.9 |
| වර්ථන පැවරුම් | 3.0 |
| ප්‍රග්ධන වියදම් | 4.2 |
| ආපසු ගෙවීම් අඩු පසු ණය දීම් | 0.1 |

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 11

## රාජ්‍ය අයවැය I

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

## රාජ්‍ය අයවැය ලේඛනය

ඉදිරි වර්ෂය තුළ රාජ්‍ය කටයුතු සඳහා දැරීමට අපේක්ෂිත වියදමත් එකී වියදම් පියවා ගැනීම සඳහා මුදල් සපයා ගන්නා මාර්ග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කරගන්නා වාර්තාව රාජ්‍ය අයවැය ලේඛනය වේ.

එය ආණ්ඩුවේ ඉදිරි මුදල් සැලස්ම වන අතර ආණ්ඩුවක ඉදිරි දැක්ම හා ක්‍රියාමාර්ග පිළිබිඹු කරන වැදගත් ලියවිල්ලක් ලෙස ද සඳහන් කළ හැකිය.

## විසර්ජන කෙටුම්පත හා විසර්ජන පනත

විසර්ජන කෙටුම්පත යනු ඉදිරි වර්ෂය සඳහා දැරීමට අපේක්ෂිත වියදම් දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශයන් වෙත ලබා ගැනීම අපේක්ෂා කරන අය මාර්ග සඳහන්කොට ආදායම් හා වියදම් අතර පරතරයක් පවතී නම් එය මූලනය කරන ආකාරයත් දැක්වෙන කෙටුම්පතකි. එය සම්මත වූ පසු විසර්ජන පනත ලෙස හඳුන්වයි.

# පරිපූරක ඇස්තමේන්තුව

විසර්ජන පනත සම්මත වූවාට පසුවත් කිසියම් අමාත්‍යාංශයකට අලුතෙන් මුදල් අවශ්‍යතාවයක් පැන නැගුන විට ඒ සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට අදාල ඇමතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව පරිපූරක ඇස්තමේන්තුව නමින් හැඳින්වේ.

# අතුරු සම්මත ගිණුම

කිසියම් අනපේක්ෂිත සිදුවීමක් නිසා (යුදමය තත්ත්වය, මැතිවරණ) නියමිත කාලයට අයවැය පාර්ලිමේන්තුව ඉදිරිපත් කොට සම්මත කර ගැනීමට අපොහොසත් වන අවස්ථාවක එය සම්මත කර ගන්නා තෙක් ඉතිරි මුදල් වර්ෂය සඳහා ඒ ඒ අමාත්‍යාංශය විසින් දැරිය යුතු වියදම් රජයේ ඒකාබද්ධ අරමුදලින් වෙන්කර ගැනීම සඳහා තාවකාලික වශයෙන් ඉදිරිපත් කළ යුතු වැය ලේඛනය අතුරු සම්මත ගිණුම නමින් හැඳින්වේ. අතුරු සම්මත ගිණුම දැක්වෙන්නේ වැය යෝජනා පමණකි එහි අතිරික්තයක් හෝ හිඟයක් නොමැත එසේම අතුරු සම්මත ගිණුම මාස තුනක්, හතරක් වැනි කෙටි කාලයක් සඳහා ඉදිරිපත් වන්නක් වන අතර අලුත් ප්‍රතිපත්ති ව්‍යාපෘති කිසිවක් එහි ඇතුළත් නොවේ

# අතුරු අයවැයක්

අතුරු අයවැයක් ලෙස හඳුන්වන්නේ එක් ආණ්ඩුවක් බලයට පත්ව සිටියදී ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය සම්මත ව තිබියදී ඊට පසුව බලයට පත්වන ආණ්ඩුව තමන්ට අවශ්‍ය සංශෝධන ඇතුළත් කොට නැවත ඉදිරිපත් කරන අයවැය ලේඛනයකි. අය යෝජනා පමනක් නොව වැය යෝජනා ද ඇතුළත් සම්පූර්ණ අයවැය ලේඛනයක

## රාජ්‍ය අයවැය ලේඛනයක් හා පෞද්ගලික අයවැය ලේඛනයක් අතර වෙනස.

පෞද්ගලික අයවැය ලේඛනයක දී පළමුව අය මාර්ග සදහන් කොට ඒ අනුව වියදම් සැලසුම් කරති.
රාජ්‍ය අයවැය ලේඛනයේ දී පළමුව දැරීමට අපේක්ෂිත වියදම් ඇස්තමේන්තු කොට පසුව එම වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය අය මාර්ග තීරණය කරන ලදී

# හිඟ අයවැය

රාජ්‍ය ආදායමට වඩා වියදම වැඩි නම් එය හිඟ අයවැයකි.

# අතිරික්ත අයවැය

රාජ්‍ය ආදායමට වඩා රාජ්‍ය වියදම් අඩු නම් එය අතිරික්ත අයවැයකී.

# තුලිත අයවැය

රාජ්‍ය ආදායම හා රාජ්‍ය වියදම සමාන මට්ටමක පවතී නම් එය තුලිත අයවැය තත්වයකි.

# රාජ්‍ය අයවැයක ස්වභාවය පරීක්ෂා කිරීම සඳහා යොදාගත හැකි මිනුම්

1. වර්තන ගිණුමේ ශේෂය
2. සමස්ත ගිණුමේ ශේෂය
3. ප්‍රථමික ගිණුමේ ශේෂය
4. ශුද්ධ මූල්‍ය හිගය

**01.** වර්තන ගිණුමේ ශේෂය යනු ආණ්ඩුවේ මූළු අයභාරය (ප්‍රදාන ලැබීම් හැර) පුනරාවර්තන වියදම් අඩුකළ පසු ඉතිරිවන ශේෂයයි.

වර්තන ගිණුමේ ශේෂය = ආණ්ඩුවේ මුළු අයභාරය (ප්‍රදාන ලැබීම් හැර) - පුනරාවර්තන වියදම්

**02.** සමස්ත ගිණුමේ ශේෂය යනු ආණ්ඩුවේ මූළ අයභාරයෙන් (ප්‍රදාන ලැබීම ඇතුළු) පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වලින් සමන්විත මූළ වියදම අඩු කළ පසු ඉතිරිවන ශේෂයයි.

සමස්ත ගිණුමේ ශේෂය = මූළ අයභාර (ප්‍රදාන ලැබීම ඇතුළු) - මූළ වියදම

**03.** ප්‍රථමික ගිණුමේ ශේෂය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මූළ අයභාරයෙන් (ප්‍රදාන ලැබීම් ඇතුළුව) රාජ්‍ය ණය සඳහා වූ පොලී වියදම් ඇතුළත් නොවූ පුනරාවර්තන වියදමත් ප්‍රාග්ධන වියදමත් යන සංරචක දෙකකින් සමන්විත වූ ආණ්ඩුවේ වියදම් අඩුකළ පසු ඉතිරිවන ශේෂයයි.

සමස්ත ගිණුමේ ශේෂයෙන් පොලී ගෙවීම ඉවත් කිරීම තුළින්ද ප්‍රථමික ගිණුමේ ශේෂය ලබාගතහැක.

ප්‍රථමික ගිණුමේ ශේෂය = මූළ අයභාර (ප්‍රදාන ලැබීම ඇතුළු) - පොලී හැර මූළ වියදම්

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 12

## රාජ්‍ය අයවැය II

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

**04. ශුද්ධ මූල්‍ය හිඟය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයභාරයෙන් (ප්‍රදාන ලැබීම් ඇතුළුව) ණය වාරික ආපසු ගෙවීම් අඩු කළ පසු රජයේ මුළු වියදම අඩුකල පසු ලැබෙන අගය.**
**(ණය වාරික ආපසු ගෙවීම් ඇතුලත් නොකොට ගණනය කරනු ලබන අයවැය ශේෂයයි)**
**මේ අනුව රාජයේ ශුද්ධ මූල්‍ය හිඟය සහ සමස්ත අයවැය ශේෂ අතර වෙනස වන්නේ ණය වාරික ආපසු ගෙවීමය.**

ශුද්ධ මූල්‍ය හිඟය = මුළු අයභාර (ප්‍රදාන ලැබීම ඇතුළු) - ණයවාරික ගෙවීම් හැර මුළු වියදම

# උදා - රජයක අයවැය පිළිබඳ තොරතුරු පහත ලබාදෙයි

බදු ආදායම - 150000
බදු නොවන ආදායම - 15000
ප්‍රදාන - 5000
පුනරාවර්තන වියදම් (ඇතුලත් පොලිය 21000) - 175000
ප්‍රාග්ධන වියදම් හා ශුද්ද ණයදීම් (ඇතුලත් ණය වාරික ගෙවීම් 50000) - 200000

වර්තන ගිණුමේ ශේෂය = ආණ්ඩුවේ මුළු අයභාරය (ප්‍රදාන ලැබීම් හැර) - පුනරාවර්තන වියදම්

වර්තන ගිණුමේ ශේෂය = 165000 - 175000

වර්තන ගිණුමේ ශේෂය = - 10000

සමස්ත ගිණුමේ ශේෂය = මුළු අයභාර (ප්‍රදාන ලැබීම ඇතුළු) - මුළු වියදම

සමස්ත ගිණුමේ ශේෂය = 170000 - 375000

සමස්ත ගිණුමේ ශේෂය = - 205000

බදු ආදායම - 150000

බදු නොවන ආදායම - 15000

ප්‍රදාන - 5000

පුනරාවර්තන වියදම් (ඇතුලත් පොලිය 21000) - 175000

ප්‍රාග්ධන වියදම් හා ශුද්ද ණයදීම් (ඇතුලත් ණය වාරික ගෙවීම් 50000) - 200000

ප්‍රථමික ගිණුමේ ශේෂය = මුළු අයභාර (ප්‍රදාන ලැබීම ඇතුළු) - පොලී හැර මුළු වියදම

ප්‍රථමික ගිණුමේ ශේෂය = 170000 - 354000

ප්‍රථමික ගිණුමේ ශේෂය = - 184000

ශුද්ධ මූල්‍ය හිගය = මුළු අයභාර (ප්‍රදාන ලැබීම ඇතුළු) - ණයවාරික ගෙවීම් හැර මුළු වියදම

ශුද්ධ මූල්‍ය හිගය = 170000 - 325000

ශුද්ධ මූල්‍ය හිගය = - 155000

# ප්‍රසාරණාත්මක අයවැය ප්‍රතිපත්තිය

අයවැය හිඟය පියවීමට ලබාගන්නා රාජ්‍ය ණය මගින් රටේ මුදල් සැපයුම වැඩි වී මිල මට්ටම් ඉහළ යාම තුළින් උද්ධමනාත්මක තත්ත්වයක් ඇති වේ නම් එය ප්‍රසාරණාත්මක අයවැය ප්‍රතිපත්තියක් ලෙස හැදින්වේ.

- රජය මහ බැංකුවේ ණය ලබා ගැනීම
- රජය වාණිජ බැංකුවලින් ණය ලබාගැනීම

රජයක් මහ බැංකුවෙන් වාණිජ බැංකුවලින් ණය ලබා ගෙන අයවැය හිඟය වීමේදී රටේ මුදල් සැපයුම ප්‍රසාරණය වේ. මේ නිසා සමස්ත ආදායමට වඩා සමස්ත වියදම ඉහළ ගොස් උද්ධමනාත්මක තත්වයක් හටගනී.

# සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්තිය

අයවැය හිඟය පියවා ගැනීම සඳහා ලබා ගන්නා රාජ්‍ය ණය මගින් මුදල් සැපයුම වැඩි වීමක් සිදු නොවේ නම් එය සංකෝචනත්මක අයවැය ප්‍රතිපත්තියකි.

- ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ණය ලබා ගැනීම
- සේවක අර්ථසාධක අරමුදලෙන් ණය ලබාගැනීම
- මහාජනතාවගෙන් ණය ලබාගැනීම

මෙවැනි ණය ලබාගැනීම තුළින් රටේ මුදල් සැපයුම වැඩි වීමක් සිදු නොවේ. එහිදී සිදුවන්නේ එම ආයතනය හෝ පුද්ගලයන් සතුව පවතින මුදල් ප්‍රමාණයක් රාජ්‍ය ණය වශයෙන් ලබාදීම සිදුවේ. ඒ නිසා උද්ධමනකාරී තත්ත්වයක් ඇති නොවේ

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 13

### රාජ්‍ය ණය

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# රාජ්‍ය ණය

ඉදිරි වර්ෂයක් තුළ ආණ්ඩුවේ අපේක්ෂිත ආදායමට වඩා එම වර්ෂය තුළ වියදම් කිරිමට අපේක්ෂිත මුළු වියදම ඉක්මවා යන අවස්ථා පවතී. ආණ්ඩුවේ ආදායමට වඩා ආණ්ඩුවේ වියදම ඉක්මවා යන විට ඇති වන අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය වන්නේ රාජ්‍ය ණය ගැනීම වේ.

මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර පහත දක්වෙන ගැලීම් සටහනින් ඉදිරිපත් කර ඇත.

**රාජ්‍ය ණය ලබා ගන්නා මූලාශ්‍ර**

- දේශීය ණය
  - වෙළෙඳපොළ
    - බැංකු අංශය
      - මහ බැංකු
      - වාණිජ බැංකු
    - බැංකු නොවන අංශය
      - ජාතික ඉතිරි කිරීමේ බැංකුව
      - සේවක අර්ථ සාධක/විශ්‍රාමික අරමුදල
      - රක්ෂණ ආයතන
  - වෙළෙඳපොළ නොවන ණය
- විදේශීය ණය
  - ව්‍යාපෘති
  - ණය ව්‍යාපෘති නොවන

# අය වැය හිඟය මූල්‍යයනය කිරීමට ණය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකකි.

- දේශීය මූලාශ්‍රය
- විදේශීය මූලාශ්‍රය

- දේශීය මූලාශ්‍ර නැවත කොටස් දෙකකි.
  - වෙළෙඳපොළ මූලාශ්‍ර
  - වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර

## වෙළෙඳපොළ මූලාශ්‍ර

ආණ්ඩවු මූල්‍ය වෙළෙඳපොළ තුළින් භාණ්ඩාගාර බිල්පත් පිළිණපත් රුපියල් ණය සුරැකුම්පත් ආදී මූල්‍ය උපකරණ භාවිත කරමින් ණය ලබා ගන්නේනම් එය වෙළෙඳපොළ මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමක් ලෙස හඳුන්වනු ලැබේ.

# දේශීය වෙළෙඳපොළ මූලාශ්‍ර නැවත කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකියි

- බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය
- බැංකු නොවන මූලාශ්‍ර මගින් ලබා ගන්නා ණය

## බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය

මහ බැංකුව ඇතුළු වෙනත් වාණිජ බැංකු මගින් ලබා ගන්නා ණය බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය ලෙස හඳුන්වයි. බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය උද්ධමනකාරී මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ලෙස ද එය හඳුන්වයි. මහ බැංකුව ඇතුළු වාණිජ බැංකු මගින් අයවැය හිඟය පියවීමට ණය ලබා ගන්නා විටආර්ථිකයේ මූල්‍ය ප්‍රසාරණයක් සිදු වේ.

# බැංකු නොවන මූලාශ්‍ර මගින් ලබා ගන්නා ණය

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සංවර්ධන බැංකු, රක්ෂණ සමාගම්, සේවක අර්ථසාධක අරමුදල වැනි වාණිජ බැංකු නොවන ණය මැවීමේ හැකියාවක් නැති ආයතනවලින් ණය ලබා ගැනීම බැංකු නොවන ණය ලබා ගැනීම් ලෙස හඳුන්වයි.

බැංකු නොවන මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම නිසා මුදල් මැවීමක් සිදු නොවන බැවින් මුදල් සැපයුමට බලපෑමක් ඇති නොවේ.

## වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර

වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර ලෙස හඳුන්වන්නේ ආණ්ඩුවේ ආයතන තුළ ඇති තැන්පතු හා අතිරික්ත අරමුදල් තාවකාලික ව අය වැය හිඟය මූල්‍යයනය කිරීමට ලබා ගැනීම යි. එවැනි තාවකාලික ව ලබා ගන්නා අරමුදල් කිහිපයකි.

- පරිපාලන ණය
- භාණ්ඩාගාරයේ තැන්පතු (මහ බැංකු අත්තිකාරම්)
- විවිධ තැන්පතු

# විදේශීය මූලාශ්‍ර

අය වැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා විදේශීය මූලාශ්‍ර මගින් සම්පත් ලබා ගන්නා මූලාශ්‍ර දෙකකි

- විදේශීය ණය
- විදේශීය දීමනා

අය වැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා විදේශීය දීමනා වලට වඩා විදේශීය ණයවැඩි වැදගත්කමක් පවතී.
අය වැය හිඟය පියවීම සඳහා විදේශීය රජයකින්, අන්තර්ජාතික මූල්‍ය ආයතන වලින් හෝ ජාත්‍යනත්‍ර වෙළෙඳපොළ වලින් ලබා ගන්නා ණය විදේශීය ණය මූලාශ්‍ර ලෙස හැඳින්වේ.

මෙලෙස ලැබෙන ණය පවතනි ණය කොන්දේසි වල ස්වරූපය අනුව සහනදායි ණය හා සහනදායි නොවන ණය වශයෙන් වෙන් කෙරේ.

සහනදායි ණයවල දී කොන්දේසි රහිත ව හෝ ඉතා අඩු පොළියක් යටතේ හෝ ණය ගෙවීමේ විරාම කාලයක් ලබා දී හෝ එම ණය ලබා දෙයි.

සහනදායි නොවන ණය වාණිජ ණය ලෙස හඳුන්වයි. ඉහළ පොළී පිරිවැයක් හා විවිධ කොන්දේසි යටතේ ලබා ගන්නා ණය සහනදායි නොවන ණය ලෙස හැඳින්විය හැකි ය.

දේශිය ණය හා විදේශිය ණය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමේදී ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය රාජ්‍ය ණයවල ආර්ථික ප්‍රතිවිපාක ලෙස හඳුන්වයි.

අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා ණය මූලාශ්‍ර වල ස්වභාවය මත එම ප්‍රතිවිපාක තීරණය වේ.

අය වැය හිඟය අඛණ්ඩ ව ඉදිරියට යාම හා රාජ්‍ය ණය ඉහළ යාම නිසා ආර්ථිකයේ අයහපත් ප්‍රතිවිපාක දෙකක් ඇති කරයි.

01. වෙළෙඳපොළ පොළී අනුපාතිකය ඉහළ යාම

02. පෞද්ගලික අංශයේ ආයෝජනය සඳහා දේශීය මූල්‍ය සම්පත්වල හිඟයක් ඇති වීම

01. අය වැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා ආණ්ඩුව මූල්‍ය වෙළෙඳපොළෙන් ණය ලබා ගැනීමත් පෞද්ගලික අංශය වාණිජ බැංකුවලින් ණය ඉල්ලීමත් හේතුවෙන් ඇති වන තරගකාරී බව නිසා ණය පොළී අනුපාතිය ඉහළ යයි.

මහ බැංකුව ඇතුළු වාණිජ බැංකු මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ආර්ථිකයේ අයහපත් ප්‍රතිවිපාක ලබා දෙයි.

02. සීමිත මූල්‍ය සම්පත් ප්‍රමාණයක් සඳහා රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය අතර තරගකාරී බව ඇති වීමෙන් පෞද්ගලික අංශයේ ආයෝජනය දුර්වල වේ

එවැනි අයහපත් ප්‍රතිවිපාක ඇති වන්නේ වාණිජ බැංකු හා මහ බැංකුව උද්ධමනකාරී මූලාශ්‍ර වීම නිසා ය.

වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර මගින් අය වැය හිඟය මූල්‍යයනය කිරීමට ණය ලබා ගැනීමෙන් එවැනි අයහපත් ප්‍රතිවිපාක ඇති නොවේ.

## පරිපාලන ණය

රාජයේ ආයතන සතු අතිරික්ත මුදල් සංචිත වර්ෂ අවසානයේ අය වැය හිඟය පියවීමට යොදා ගැනීම පරිපාලන ණය වේ. මෙමගින් මූල්‍ය ප්‍රසාරණයක් ඇති නොවන අතර උද්ධමනකාරී බලපෑම් ඇති නොවේ.

## විදේශීය ණය හා ප්‍රදාන

විදේශීය ණය හා ප්‍රදාන නිසා ද ආර්ථිකයේ මූල්‍ය ප්‍රසාරණයක් ඇති විය හැකිය. විදේශීය මූලාශ්‍ර අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගැනීම නිසා විදේශ වත්කම් ප්‍රමාණය ඉහල යාමෙන් මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරන අතර විදේශිය ණය සහ දීමනා දේශිය මුදල් වලට බලපෑම් කිරිමෙන්ද ආර්ථිකයේ ප්‍රසාරණාත්මක බලපෑමක් එල්ල වේ.

දේශීය ණය සඳහා පොළී ගෙවීම් පුනරාවර්තන වියදම් ඉහළ යාමට හේතු වී ඇත. එය වර්තන ගිණුමේ හිඟයක් ඇති වී රාජ්‍ය ඉතුරුම් පහළ යාමට හේතු වේ.

දේශීය ණය මූලාශ්‍ර අතරින් බැංකු අංශයෙන් ණය ලබා ගැනීම මගින් මුදල් සැපයුම් ප්‍රසාරණාත්මක බලපෑම් ඇති කරයි ඒ නිසා භාණ්ඩ වල හා සේවා වල මිල ගණන් ඉහළ යාම නිසා ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වයක් ඇති වේ.


දේශීය ණය ඉහළ යාමත් බැංකු මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමත් නිසා පෞද්ගලික අංශය වාණිජ බැංකු වෙතින් ණය ඉල්ලුම් කිරීමෙන් ආර්ථිකයේ පොළී අනුපාතිකය ඉහළ යාම කෙරෙහි බලපෑම් ඇති කරයි.

# රාජ්‍ය ණය ලබා ගැනීමේ ආර්ථික ප්‍රතිවිපාක කිහිපයක් පහත දැක් වේ

- විශාල වශයෙන් ණය ලබා ගැනීම නිසා පොළී ගෙවීම් ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය ඉතුරුම් පහළ යාම සහ ආයෝජනය පහළ යාම.

- රාජ්‍ය ණය ඉහළ යාම නිසා ණය වාරික සහ පොළිය ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය වියදම් ඉහළ යාම.

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වඩාත් දුෂ්කර වීම.




2018 - රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්වීය
ආදායම සහ ප්‍රදාන
13.4
(13.7)
ආදායම් බදු
2.1
(2.0)
අනෙකුත් බදු
2.5
(2.6)
එකතු කළ අගය මත බදු
3.2
(3.3)
නිෂ්පාදන බදු
3.4
(3.5)
බදු නොවන
1.4
(1.2)
ආනයන බදු
0.7
(1.0)
ප්‍රදාන
0.1
(0.1)
වියදම්
18.6
(19.2)
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණයදීම්
4.2
(4.8)
පොලිය
5.9
(5.5)
වැටුප් සහ වේතන
4.3
(4.4)
අනෙකුත්
2.4
(2.0)
විශ්‍රාම වැටුප්
1.3
(1.3)
සමෘද්ධි
0.3
(0.3)
පොහොර සහනාධාර
0.2
(0.2)
පුනරාවර්තන වියදම්
14.5
(14.4)
ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ස්ථායිතාවය
ප්‍රධාන කරුණු
2018
(2017)
(දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)
රාජ්‍ය මූල්‍ය ශේෂ
2018
0.6
-1.2
-5.3
ප්‍රාථමික ශේෂය
වර්තන ගිණුම් ශේෂය
සමස්ත අයවැය ශේෂය
අය වැය හිඟය මූල්‍යනය
බැංකු නොවන
2.3
(0.8)
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර
2.7
(1.7)
මහ බැංකුව
1.7
(-1.4)
විදේශ ව්‍යාපෘති ණය
0.1
(0.0)
වාණිජ බැංකු
-0.9
(2.8)
අනෙකුත් ණය
0.5
(1.6)
දේශීය මූල්‍යනය (රු.බිලියන)
437.2
(294.3)
විදේශීය මූල්‍යනය (රු.බිලියන)
323.5
(439.2)
ප්‍රතිපත්ති රාමු
- නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම
- සක්‍රිය වගකීම් කළමනාකරණ පනත නීතිගත කිරීම
2018
82.9%
10.8%
2017
76.9%
9.0%
මධ්‍යම රජයේ ණය / ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නි)
දේශීය ණය(අ) (රු.බිලියන)
6,018
විදේශීය ණය(අ) (රු.බිලියන)
5,960
(අ) 2018 වසර අග දී

කුෂාණි විජේහැන්නැදිගේ

# 2019 - අයවැය




## මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක අභියෝගාත්මකය(ආ)




(ආ) මැදිකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව 2019 වසරේ තුන්වන කාර්තුව තුළ දී සංශෝධනය වනු ඇත.

# ආර්ථික විද්‍යාව

## 8 වන පාඩම - video 14

## සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්ති

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්ති

සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්ති යනු සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වන අතර ඒවා මගින් අපේක්ෂා කරනුයේ වෙළෙඳපොළ ආර්ථිකයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් ආර්ථික වෘද්ධිය වේගවත් කිරීම යි.

සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන විට ආයෝජනය වැඩි වීම සහ නිෂ්පාදන පිරිවැය අඩු වී නිෂ්පාදන සාධකවල ඵලදායිතාව ද වැඩි වීමට හේතු වේ.

ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් අපේක්ෂිත මට්ටම් කරා ගෙන ඒමට සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය මගින් කටයුතු කරනු ලැබේ.

# සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්තිවල උපකරණ කිහිපයක්.

- බදු ප්‍රතිසංස්කරණ
- ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ
- නියාමනහරණය
- පෞද්ගලීකරණය
- ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ

# බදු ප්‍රතිසංස්කරණ

නිෂ්පාදනය ඉහළ නැංවීමට අනුබලයක් ලැබෙන සේ බදු ක්‍රමයෙහි වෙනස්කම් ඇති කිරීම බදු ප්‍රතිසංස්කරණ ලෙස හැඳින්වේ

- වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට බදු අය කිරීම මගින් යම් යම් බලපෑම් ඇති කරනු ලබයි

- බදු හේතුවෙන් නිෂ්පාදනයේ පරිභෝජනයේ ආයෝජනයෙන් ඉතිරි කිරිම් වලත් ප්‍රශස්ත මට්ටමට ළඟා විය නොහැකි වේ.

# ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ

ශ්‍රම වෙළෙඳපොළ ඇති දෘඩතාවන් ඉවත් වන ආකාරයෙන් ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම සම්බන්ධයෙන් වෙනස්කම් ඇති කිරීම ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය ලෙස හැඳින්වේ

නිදසුන් :

- පීඩාකාරී කම්කරු නීති ඉවත් කිරීම
- තරගකාරී ශ්‍රම වෙළෙඳපොළක් බිහි වීම
- ඒ ඒ වෘත්තීන් සඳහා පුහුණු වීම් පිළිබඳ ව දැනුම්වත් කිරීම

ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යාංශය විසින් වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.

- සේවකයන්ගේ අවම වැටුප ජාතික වේතන පනත යටතේ 2016 සිට අවම වැටුප රු. 10 000 ක් ලෙස නීතිගත කිරීම
- විදේශ රැකියා සඳහා යන අයගේ ශිල්පීය නිපුණතා වර්ධනය කිරීමේ වැඩ සටහන් සැකසීම
- මැද පෙරදිග හැර වෙනත් කලාප ඉලක්ක කර ගැනීම තුළින් ශ්‍රම වෙළෙඳපොළක් ඇති කර ගැනීම
- ශ්‍රමිකයන් පුහුණු කිරීම ආදී වැඩ සටහන් ක්‍රියාත්මක වේ.

# නියාමනහරණය

ආර්ථිකයට තරගකාරීත්වය අඩු වීමට බලපාන නීතියෙන් පනවන ලද හා සමාජීය ලෙස ඇති වී තිබෙන රෙගුලාසි හා බාධා ඉවත් කිරීම නියාමනහරණයයි

නිදසුන් :

- ව්‍යාපාරයක් ආරම්භ කිරීම සම්බන්ධ ව පවතින දැඩි නීතිරීති ලිහිල් කිරීම
- නිදහස් වෙළෙඳාමට බාධා වන ආකාරයේ රජයේ දැඩි අධීක්ෂණය අඩු කිරීම

# පෞද්ගලීකරණය

රජයේ හිමිකාරිත්වය යටතේ පැවති ව්‍යාපාර පෞද්ගලික අංශයට විකිණීම, බදුදීම, කළමනාකරණය පමණක් පැවරීම පෞද්ගලීකරණය යනුවෙන් හැඳින්වේ.

ඒ තුළින් පහත සඳහන් හිතකර තත්ත්වයන් ළඟා කර ගත හැකිය.

- වඩාත් ඵලදායි ලෙස නිෂ්පාදන සම්පත් නිෂ්පාදන කටයුතුවලට යෙදවීමෙන් නිෂ්පාදනය සාර්ථක වීම
- රාජ්‍ය ඒකාධිකාරය අහෝසි වී තරඟකාරී වෙළෙඳපොළක් බිහි වීම
- නිෂ්පාදිතවල ගුණාත්මක තත්ත්වය ඉහළ යාම
- ප්‍රාග්ධන හිඟයට පිළියමක් වීම
- ව්‍යාපාරවලට කෙරෙන දේශපාලන බලපෑම් ඉවත් වීම

ශ්‍රී ලංකාවේ පසුගිය දශක කිහිපය තුළ රාජ්‍ය හිමිකාරිත්වය යටතේ පැවති රාජ්‍ය සංස්ථා රාජ්‍ය සමාගම් පෞද්ගලීකරණය තුළින් ඉහත කරුණු අපේක්ෂා කෙරිණි. එමගින් සාර්ථකත්වයක් ලැබූ ආයතන මෙන් ම අකාර්යක්ෂම වූ ආයතනද දක්නට විය.

# ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ

නිෂ්පාදන ඉහළ නංවා ගැනීම සඳහා බාධාවක් ව පවතින ප්‍රාග්ධන හිඟය විසඳාගත හැකි ආකාරයට කටයුතු කිරීම ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ ලෙස සැලකිය හැකි යි

නිදසුන් :

- ප්‍රාග්ධනයේ ඵලදායිතාව නැංවීම
- ඍජු විදේශ ආයෝජන දිරිමත් කිරීම
- සහනදායි කොන්දේසි මත විදේශ ණය ලබා ගැනීම
- ඉතිරි කිරීම් වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම

පසුගිය වසර කිහිපය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ප්‍රාථමික වෙළෙඳුන්ගේ ව්‍යාපාර ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වූව ද මෙහෙයුම් කටයුතුවල සුළු කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදි.

ඉහත ප්‍රතිසංස්කරණ තුළින් ආයෝජන වැඩි වී නිෂ්පාදනය ඉහළ යාම හිතකර තත්ත්වයක් වේ. එසේ ම අහිතකර තත්ත්වයන් ද උදා විය හැකි ය.

නිදසුන් :

- විදේශ ආයෝජන වැඩි කිරිම තුළින් ලාභ හා ලාභාංශ විදේශ රටවලට ඇදී යාම
- විදේශ ණය ලබා ගැනීම නිසා ණය වාරික හා පොළිය ලෙස විශාල මුදල් වැය වීම.
- රාජ්‍ය වර්තන වියදම් අඩු වීම සමාජ ශුභසාධනයට අහිතකරවීම

සැපයුම ප්‍රවර්ධන ප්‍රතිසංස්කරණ ලෙස ඉහත ප්‍රතිසංස්කරණයන් යොදාගැනීමේ දී අහිතකර ප්‍රතිඵල අවම වන අන්දමට යොදා ගත යුතු වේ.